# වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමි සහ සිල්වෑ සමාගම

# දහනවවැනි සියවසේ බෞද්ධ පුනර්ජීවයට දායකත්වය ලබාදුන් පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ විමසුමක්

ශාස්ත්‍රවේදී අජිත් තල්වත්ත

මෙරට බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පිරිවෙන කේන්ද්‍රකරගත් අධ්‍යාපන රටාවක් පුරාතනයේ සිට පැවතිණි. සිංහල ජාතිය, විශේෂයෙන් බෞද්ධ ගිහි පැවිදි දෙපක්ෂය තම සංස්කෘතික පැවැත්ම, පරම්පරා උරුමයන් ආරක්ෂා කර ගැනීමේ මාධ්‍ය කේන්ද්‍රය වශයෙන් සැලකුයේ ද පිරිවෙනයි. බුදු සමයේ ඉගැන්වීම් පදනම් කොට බිහි වූ සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමයක් මෙය මුල්කර වර්ධනය විය. මෙය භික්ෂු අධ්‍යාපනය යයි කීම ඓතිහාසික වශයෙන් විමර්ශනයේදී උචිත වුවත් එය තවදුරටත් විග්‍රහ කරතොත් බෞද්ධ අධ්‍යාපනයෙහි අඛණ්ඩ ස්වරූපයක් හා ක්‍රියාවලීන් සම්බන්ධව පවත්නා අධ්‍යාපන ක්‍රමයක් බව අතිශයින් ප්‍රකට කරුණකි.[1] ව්‍යක්ත ලෙස ධර්ම කරුණු දේශනා කිරීම හා ඇසූ දේ තහවුරු කරදීම භික්ෂූන් වහන්සේගේ වගකීම බව සිගාලෝවාද සූත්‍රයේදී බුදුන් වහන්සේ විසින් දේශනා කොට ඇත.[2] මෙම කරුණ අකුරටම අනුගමනය කළ භික්ෂූහු ධර්මය දේශනා කිරීම හා ඉගැන්වීම තම ජීවිතයේ උත්තරීතර කාර්‍යයක් වශයෙන් සළකා ඒ අනුව දෛනික ශාසනික ප්‍රතිපදාවෙහි නිරත වූහ. මෙම අධ්‍යයනයේදී මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ නොයෙක් බාධක හමුවේ විකාශනය වී සරණංකර සංඝරාජ හිමියන් පුරෝගාමීත්වයෙන් නැවත උද්දීපනය වූ පිරිවෙනල බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය අවධියේදී ඇතිවූ බෞද්ධාගමික පුනර්ජීවනය තුළ ඉටුකළ උදාර මෙහෙවර විමර්ශනයට ලක් කිරීමයි.

ක්‍රිස්තු පූර්ව 3 වන ශත වර්ෂයේ මධ්‍යභාගයේ පමණ මිහිඳු හිමියන් විසින් මෙරටට බුදු දහම හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් බුදු දහමත් බෞද්ධ සංස්කෘතියත් ඉතා තදින් මුල්බැස ගත්තේය. බෞද්ධ සංසකෘතියත් සමඟ බෞද්ධ අධ්‍යයන ආයතන බිහිවීම ද සිදුවිණි.[3] එම පසුබිම මඟින් ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයක් ආරම්භ විය. මහින්දාගමනයෙන් පසුව සකස් වූ බෞද්ධ අධ්‍යාපනය මූලික වශයෙන් දේශීය අධ්‍යාපනයේ පදනම විය. පැරණි ශ්‍රී ලංකාවේදීත්, ඉන්දියාවේදී මෙන්ම පාලක පංතියත්,

ප්‍රභූ පංතියත්, සාමාන්‍ය ජනතාවත්, භික්ෂූන්ගෙන් අධ්‍යාපනය ලබා ගත්හ. ආගමික අධ්‍යාපනය මෙන්ම, ආගමික නොවූ අධ්‍යාපනය ද භික්ෂූන් අතින්ම සිදුවිය. ගිහියන්ට සිප් සතර හැදෑරීමට හා ඔවුන් යහමඟ යැවීම භික්ෂූන්ගේ කාර්යයක් බවට පත්විය.[4]

දේශීය අධ්‍යාපන ක්‍රමයට අනුව ශිෂ්‍යයන් අධ්‍යාපනය ලබා දෙන ලද ගමේ පන්සල වැදගත් ආයතනයක් බවට පතවිය. ස්වදේශීය අධ්‍යාපනයේ උසස්ම තත්ත්වය වූයේ පිරිවෙන් අධ්‍යාපනයයි. ගමේ පිහිටි පන්සල දිවයිනේ ඉතා වැදගත් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය විය.[5] භික්ෂූන් වහන්සේ ගුරුවරයා බවට පත්වී පන්සල පාසලක් බවට පත්විය. මෙරට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීමෙන් පසුවද ටික කලක් ගතවන තුරු මෙම අධ්‍යාපන ආයතන නොකඩවාම පැවැත්විණ. අධ්‍යාපනය ලැබීමේ දී මූලිකව කියවන ලද පොතපත ලෙස 'මගුල් ලකුණ', 'ගණදෙවි හැල්ල', වදන් කවි පොත', 'සකස්කඩ' යන ඒවා වැදගත් විය.

පිරිවෙන යන වචනය පිළිබඳව අර්ථවිවරණයක් කිරීම මෙහිදී අවශ්‍ය බව පෙනේ. මෙම වචනය ව්‍යවහාරයට පත්ව තිබෙන්නේ පාලි භාෂාවේ එන 'පිරිවෙන' යන ශබ්දය පිටපත් කර තිබේ.[9] උන්වහන්සේ පවසන්නේ මෙම කාලයේ මෙහි භික්ෂූන් 3000 ක් පමණ වාසය කළ බවයි. එයින් පුරාණ ලංකාවේ ආරණ්‍යවල විශාල පිරිසක් අධ්‍යාපනය ලැබූ බව අවබෝධ වේ. පිරිවෙන් වැනි ආයතන සෑම පන්සලකම නොවූ අතර ඇතැම් ඒවා උසස් අධ්‍යාපන ආයතන වශයෙන් විහාරස්ථානවල පැවතිණ.[10] එයින් ලැබුණු පිටුවහල මඟින් පුද්ගලයා යහපත් අයකු වූ අතර ලබාගත් අධ්‍යාපනය නිසා ශික්ෂාකාමී සුචරිතවත් පිරිසක් බිහි විය. ව්‍යාකරණ, ඡන්දස් අලංකාර ශාස්ත්‍රය, සාහිත්‍යය, ඉතිහාසය, අංක ගණිතය, ජ්‍යොතිෂය හා වෛද්‍ය ශාස්ත්‍රය යන විෂයයන් අධ්‍යාපන විෂයට ඇතුළත් විය. එසේ වර්ධනය වූ පන්සල ආශ්‍රිත පිරිවෙන් වැනි ආයතන පවත්වාගෙන යාමට එකල රජවරුන් නොයෙක් ගම්වර පූජාකර රාජානුග්‍රහය ලබාදෙනු ලැබිය. ඊට අමතරව සාමාන්‍ය ජනයාගෙන් ලැබුණු සහය තුළින් පන්සල් රැකබලා ගැනීමට හැකිවිය. රට අභ්‍යන්තරයේ දේශපාලන අස්ථාවර භාවයන් සහ වර්ධනය වූ නොයෙක් කැරලි කෝලාහල තත්ත්වයන් තුළින් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය ක්‍රමයෙන් බිඳ වැටුණි.. මෙපරිද්දෙන් වරින් වර ඇති වූ සිද්ධීන් නිසා පිරිවෙන් පිරිහී ගිය නමුත් 6 වැනි පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1412-1467) රාජ්‍ය සමයේදී නැවතත් පුනර්ජීවනය විය මෙම කාලයේ පැවතුණු ස්වදේශීය සාහිත්‍ය මඟින් පිරිවෙන් දියුණුව පැවති ආකාරය පිළිබඳ

තොරතුරු ලැබේ. එකල පැවති පිරිවෙන් ලෙස කැරගල පද්මාවතී පිරිවෙන (රාජගුරු වනරතන සංඝරාජ හිමි) රයිගම ශ්‍රී ගුණානන්ද පිරිවෙන (මහානේත්‍ර පාදමූල මෛත්‍රී හිමි පැපිලියානේ සුනේත්‍රාදේවී මහා පිරිවෙන (ත්‍රිපිටක මංගල සංඝරාජ හිමි) යන අය යටතේ ද පාලනය විය. 15 වන සියවසේ හයවන පරාක්‍රමබාහු රජ සමයේදී මෙරට පිරිවෙන් උපරිම වශයෙන් දියුණු විය.එනමුත් මෙසේ පැවති පිරිවෙන් අධ්‍යාපනය, අතීතයේ සිට සිංහල රජවරුන්ගේ ආධාරයෙන් ඉදිරියට රැගෙන ආවද කෝට්ටේ යුගයේ සිට ධර්මපාල රජතුමා ආදායමින් වැඩි කොටසක් පෘතුගීසි මිෂනාරීන්ට පරිත්‍යාග කළේය.[11] මිෂනාරි අධ්‍යාපන ක්‍රමයත්, විදේශීය ආධිපත්‍යයත් නිසා මෙරට බෞද්ධ ජනයාට දැඩි බලපෑම් එල්ල විය. අනෙක් බෞද්ධ ජනතාව විශාල වශයෙන් නොයෙක් ලාභ අපේක්ෂාවෙන් ක්‍රිස්තියානි දහම වැළඳ ගන්නා ලදි. මෙම පසුබිම මත බෞද්ධ අධ්‍යාපනය තරමක් දුරට බිඳ වැටිණි. එපමණක් නොව දේශීය අධ්‍යාපන ආයතන වලට විදේශීය පාසල් සමඟ තරග කිරීමට නොහැකි වීම තුළින් පිරිවෙන් අධ්‍යාපනය පසුබෑම වඩාත් වේගවත් විය.

මෙසේ පසුබෑමට ලක් වූ පිරිවෙන් අධ්‍යාපනය යළි පුනර්ජීවනයට පත් වන්නේ මහනුවර රාජධානි අවධියේ විසූ අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන්ගේ පුරෝගාමීත්වයෙන් ඇරඹි බෞද්ධාගමික ව්‍යාපාරයත් සමඟය. මහනුවර යුගයේ පිරිහෙමින් පැවති බුදු සසුනත් සඟපරපුරත් නගා සිටුවා, ධර්ම ශාස්ත්‍ර ප්‍රදීපය යලිත් දැල්වීමෙන් උන්වහන්සේ විසින් කරණ ලද ශාසනික හා ශාස්ත්‍රීය සේවය සමස්ත ලංකාවාසී බෞද්ධ ජනතාව විසින් අනුස්මරණය කරනු ලබන්නේ අසීමිත ගෞරවයකිනි.[12] වැලිවිට සංඝරාජ හිමියන්ගේ මූලිකත්වයෙන් පිහිට වූ පර්ෂදය නිසා ධර්ම ශාස්ත්‍රල භාෂා ශාස්ත්‍ර පුනරුදය යළි ආරම්භ වේ. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ආශ්‍රය ලබා උන්වහන්සේ නියමකන්ද ස්ථානයේ ආරම්භ කළ පිරිවෙන මෙවක මුල්ම ශාස්ත්‍රායතනය සේ සැළකේ.[13] මෙම අවධියේ භික්ෂු සමාජය පරිහානියට පත්ව තිබුණත් එය නගා සිටුවීමේ අරමුණින් කරනු ලැබූ උදාර මෙහෙවර අතිමහත්ය. මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල පඬිතුමා විසින් සිල්වත් සමාගම ගැන මෙසේ විග්‍රහ කර ඇත. 'එය එදා ලංකාවේ භික්ෂුඅධ්‍යාපනය පිළිබඳ පැවති මධ්‍යස්ථානය විය. සිය ගණන් භික්ෂූහු එහි ඉගෙන ගෙන එයින් ධර්මශාලා ශාස්ත්‍රය බෙදා දුන් තැන හැටියට නියමකන්ද වෙසෙසින් සිහි කළ මනාය. පෙර පඬිවරුන් පහළ වී සියවස් දෙකකට වැඩි කාලයක් තුළ භික්ෂු අධ්‍යාපනය නැතිවීමෙන් මෙරට තිබූ

ශාස්ත්‍රාන්ධකාරය නැති වී ශාස්ත්‍රාලෝකය දිවයිනේ බබලන්නට වූයේ එතැන් සිටය.[14] සිල්වත් සමාගම ආරම්භ කර සාමණේරවරුන්ට තමා දන්නා සියල්ල ඉගැන්වූහ. සරණංකර හිමියන් ඇති කළ සිල්වත් සමාගමේ ප්‍රධාන ශිෂ්‍යවරයන් වශයෙන් සිටියේ සිටිනා මළුවේ සිල්වත් තෙරුන් වහන්සේ, ඉලිපත්ගමුවේ තෙරුන් වහන්සේ, කදිරාගොඩ තෙරුන් වහන්සේ ආදී තෙරවරුන්ය. සරණංකර හිමියන්ගේ ශාසනික සේවය තුළ එක් ස්ථානයක සිට සිය ධර්ම ප්‍රචාරක කටයුතු සිදුකර නැත. තැනින් තැන සැරි සරමින් සිය කටයුතු කර තිබේ. ප්‍රධාන වශයෙන් ධර්ම ශාස්ත්‍රය දියුණු කිරීමේ අදහසින් රජුගෙන් ලැබූ සහය නිසා සරාර්ථ සංග්‍රහය, ධර්ම ප්‍රකරණය, මහා බෝධි වංශ සන්නය ද සිංහල භෙසජ්ජ මංජුසාව වැනි කෘතින් කරණු ලැබිය.[15] පැවිද්දන්ට දිනචරියා මුල්කර විනය ද, වියරණය ඇතුළු ශබ්ද ශාස්ත්‍රය ද ඉගැන්වූ අතර ගිහියනට ලේඛනය, හෝඩිය, ඇණවුම් ශාස්ත්‍ර හෝ මූලික පොත හා කියවීම ද ප්‍රගුණ කළහ. ඒ නිසාම සාමාන්‍ය අධ්‍යාපනයත් ශාසනික කටයුතුවල එක්තරා ප්‍රබෝධයක් ඇතිවූ අතර සරණංකර හිමිගේ ක්‍රියාදාමය කෙරේ මල්වතු අස්ගිරි විහාරවල භික්ෂූන්ගේ හා ගිහිභවතුන්ගේ දැඩි සැලකිල්ල හා භක්තිය ඇතිවිය.

මෙම හිමියන්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ ලංකාවේ නැතිවී ගිය උපසම්පදාව නැවත මෙරට ඇති කර බුදු සසුන නැවත පිහිටුවා එය චිරාත් කලක් යෙහෙන් පවත්නා පිණිස ස්ථාපනය කිරීමය. රාජ අනුග්‍රහය අවශ්‍ය නිසා නරේන්ද්‍රසිංහ රජු දැනුවත් කළ නමුත් එතරම් සාර්ථක නොවීය. කුමන හෝ දේශයකින් උපසම්පදාව ගෙන ඒම සඳහා ශ්‍රී ලංකාවෙන් ඒ ඒ රටවලට යැවිය යුතු සන්දේශ පාලි භාෂාවෙන් රචනා කොට සියමය. රක්ඛංගයට ඒවා ගෙනයන ලෙස තම ශිෂ්‍යයන්ට භාරකර තිබේ.[16] ඔහුගෙන් පසු බලයට පැමිණි ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ශ්‍රී ලංකාවේ වර්තමාන දියුණුවට පෙර කළ අධ්‍යාපනය හා ධර්මශාස්ත්‍රය නගාසිටුවීමට වැලිවිට හිමින්ට අනුග්‍රහය ලබා දී එහි පුරෝගාමී වූ පුද්ගලයා විය. මෙවැනි පසුබිමක් තුළ සරණංකර හිමියන් බොහෝ ජනප්‍රිය වූ අතර උඩරට පහතරට කතෝලික බලය මෙහෙය වූ පූජකවරු මහත් බියට පත් විය. එපමණක් නොව සරණංකර හිමියන් හා ගෝල පරපුර මරණයට පත් කිරීමට තරම් කතෝලිකයන් විසින් කටයුතු කළ බව මන්දාරම් පුවතේ සඳහන් වේ.[17]

ශ්‍රී විජය රාජසිංහ රජතුමා විසින් සරණංකර හිමියන්ට 'රාජගුරු' යන ශ්‍රේෂ්ඨ ගෞරව නාමයෙන් පුදනු ලැබුවේය. සරණංකර හිමියන්ගේ සිත තුළ මෙතෙක් කල් පැවති උපසම්පදාව ඇතිකර ශාසනයේ

අභිවෘද්ධියට රජුගේ නොමද අනුග්‍රහය ලබාගත් බව පෙනේ. රටපුරා රාජානුග්‍රහය ලැබීමෙන් බෞද්ධ ධර්මය පිළිබඳ මිත්‍යා අදහස් නැති වී නිවැරදි බුදුන් වදාළ ධර්මය ජනතාවට අවබෝධ කරගැනීමට හැකි විය. සරණංකර හිමියන්ගෙන් ඇරඹුණු ශාස්ත්‍ර ශාලා නිසා පැරණි අධ්‍යාපන ක්‍රමය මුලුමනින්ම නැවත ක්‍රියාත්මක වූ අතර දුෂ්කරතා මධ්‍යයේ සොයගත් පුස්කොළ පොත් වටහා ගැනීමට සන්නස්, ගැටපද රචනා කරන්නට විය. මේ නිසා ධර්ම ශාස්ත්‍ර ඥානයත් භාෂා හා ව්‍යාකරණ විධි පිළිබඳ තුලනාත්මක ඥානයත් එකවර ශිෂ්‍යයන් තුළ වර්ධනය වූ අතර මෙම ක්‍රමය අති සූක්ෂම අධ්‍යාපන න්‍යායක් ලෙස පැහැදිළිව පෙනුනි.[18] මෙම කාලයේ භාවිතා කළ ඉතා වැදගත් ග්‍රන්ථ අතර හෙරණ සිඛ ගැටපදය, දසධම්ම සූත්‍ර සන්නය, නව ගුරු සන්නය, අභිධර්ම කමටහන, ලෝකෝත්තර සංග්‍රහය[19] ඒ අතර ප්‍රමුඛ විය. බුදු සසුන ප්‍රචලිතව පැවති අග්නිදිග ආසියාවේ බොහෝ රටවල පාලි බසට ප්‍රමුඛස්ථානයක් හිමිවිය. වැලිවිට හිමියන් එය ජීව භාෂාව වශයෙන් ගෙන ලක්දිව ව්‍යාප්ත කිරීමට කටයුතු කරනු ලැබිය.

සරණංකර හිමියන්ගේ අප්‍රතිහත ධෛර්යයේ හා ශාසනික පැවැත්මේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රසාදයට පත් කීර්ති ශ්‍රී රාජසිංහ ලක්දිව මහත් ප්‍රයත්නයක් දරා බොහෝ ප්‍රදේශවල ශාස්ත්‍ර ශාලා පිහිටුවීමට පියවර ගත්තේය.[20] මල්වතු, අස්ගිරි විහාරවලත්, ගංගාරාමය, අම්පිටිය. නිත්තවෙල, සුදුහුම්පොල ශාස්ත්‍ර ශාලා පිහිටුවා පිළිගත් උගතුන්ට භාර කරන ලදි. ඒවායේ නඩත්තුවට ගම්වරයන් ද පුදනු ලැබීය. දකුණු, රුහුණු ප්‍රදේශය පුරා මුහුදු කරයට ආසන්නව ධර්මයත්, භාෂා ශාස්ත්‍රයත් ඉගැන්වීම සඳහා විහාරස්ථාන තෝරා ඒ සඳහා පහසුකම් සැලැස්විය. එපමණක් නොව වලංගු අධ්‍යාපනයක් පවත්වාගෙන යාමට හැකිවන සේ රාජකාරි ඉටු කිරීමට 'ශිල්පශාලා ව්‍යවස්ථා නිළය' නව තනතුරක් ඇති කළේය.[21] මෙසේ පිහිටුවන ලද ශාස්ත්‍රශාලා සියල්ල විහාරාරාමවල පැවති අතර ගිහි පැවිදි සියල්ලන්ම එහි අධ්‍යාපනය හා පුහුණුව ලැබූහ.[22] එහෙත් මෙම ආයතන කිසිවක් පිරිවෙන් යන නමින් හඳුන්වා නැත. ඉහත සඳහන් කළ නියමකන්දේ පිරිවෙන් විද්‍යායතනය ද හඳුන්වා ඇත්තේ ආරාමයක් වශයෙනි.[23] මින් පැහැදිළි වන වැදගත් කරුණක් වන්නේ පැවති පිරිවෙන් අධ්‍යාපනය අභාවයට ගොස් ඒ වෙනුවට පන්සල් අධ්‍යාපනයක් ඇති වීමයි. ඉහත සඳහන් කළ නියමකන්දේ පිරිවෙන හැරුණු විට සඟරජ හිමියෝ ගඩලාදෙණිය සද්ධර්මතිලක විහාරයෙහි ද වැදගත් උසස් විද්‍යායතනයක් ඇති කළහ.[24] ගංගාරාමය, රිදීවිහාරය, දඹුළු විහාරය, දෙගල්දොරු විහාරය,

අනුරපුර අටමස්ථානය ආදිය පිළිසකර කරවා ඒවායේ විසූ ආරාමවාසී මහතෙරවරුන් මඟින් ආගම ධර්මය, අක්ෂර, ශබ්ද ශාස්ත්‍ර ඉගැන්වීමේ කටයුතු අරඹා මහත් සේවාවක යෙදුණහ. මාහිමියන්ගෙන් උගත් ගිහි පැවිදි දෙපක්ෂයම ශාස්ත්‍ර ඉගැන්වීමේ මධ්‍යස්ථාන ඇතිකොට ගෘහීය වූද ශාස්ත්‍ර වූද මහත් ප්‍රබෝධයක් ඇති කළහ. එබඳු මූලස්ථාන එක එල්ලේම පිරිවෙන් ආයතන වශයෙන් නොහැඳින් වුවද නූතන පිරිවෙන් ක්ෂේත්‍රයේ 19 වන සියවසේ අගභාගයේ බිහි වූ පුළුල් ව්‍යාප්තිය කරා පිරිවෙන් ගුරුකුල වල ආරම්භය ඉහත පෙන්වාදුන් ආයතන නිසා වර්ධනය විය.

විශේෂයෙන්ම ක්‍රි.ව. 1796 දී මෙරට ස්ථාපිත කළ ඉංග්‍රීසි බලය යටතේ 1815 වන තුරුම රජය පිළිගත් එකම ආගම වූයේ ක්‍රිස්තියානි ආගමයි. 1815 උඩරට ගිවිසුම මඟින් එහි අඩංගු පස්වන වගන්තිය මගින්ද 1818 උඩරට ප්‍රකාශනයේ 21 වන වගන්තියෙන්ද බුදු දහමේ ආරක්ෂාව සඳහා පියවර ගන්නා ලද බව පෙනේ. එසේම 1831 කෝල්බෲක් කොමිසම මෙරටට පැමිණෙන විට මෙරට පැවති පාසල් අතර රජයේ පාසල්, මිෂනාරි හා පෞද්ගලික පාසල් ප්‍රධාන විය. එහෙත් මෙම කාලයේ පන්සල් ආශ්‍රිතව පැවති අධ්‍යාපන ක්‍රමය වඩා වැදගත් තත්ත්වයක නොතිබිණි.

1870 වකවානුව වනවිට මෙරට බෞද්ධයන් තුළ බලවත් ව්‍යාකූල භාවයක් පැවතුණා පමණක් නොව ඔවුන් බ්‍රිතාන්‍ය රජයෙන් බලාපොරොත්තු වූ අපේක්ෂාවන් ද ඉටු නොවිය. 1815 මහනුවර ගිවිසුම අත්සන් කිරීමෙන් බ්‍රිතාන්‍ය රජය කෙරෙහි තබන ලද විශ්වාසය හා ඒ අනුව ඇති කරගන්නා ලද සියළු බලාපොරොත්තු මුළුමනින්ම සුන්විය.[25] ක්‍රිස්තියානි පූජකයින් බෞද්ධ ඇදහීම් වලට විරුද්ධව චෝදනා එල්ල කිරීම හා අභියෝග කිරීම මුහුදු බඩ පළාත්වලට සීමා වූ නමුත් ක්‍රමයෙන් උඩරට පළාත් වලටද පැතිරෙමින් පැවතිණ. මොවුන්ගේ ක්‍රියාකාරිත්වය නිසා ක්‍රිස්තියානි අධ්‍යාපනයක් නොලද වුන් අසීලාචාරයන් සේ සළකන ලදි. එවන් පුද්ගලයින් හඳුන්වන ලද්දේ ආගමක් නැති ම්ලේච්ඡයන් 'පෙති පිළිම වන්දනා කරුවන්' ලෙසයි. මෙවන් පසුබිමක් ගොඩනැගෙමින් පැවති අවධියක මිෂනාරි ව්‍යාපාරයට රජයේ සහය ලබාදීමත් බෞද්ධ අධ්‍යාපනික කටයුතු වලට ආධාර නොලැබීමත් නිසා පන්සල් පාසල්වල වැදගත් කම ක්‍රමයෙන් හීනවී ගියේය. විශේෂයෙන් ලංකා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවෙන් වරින් වර පනවන ලද අණ පනත් හා රෙගුලාසි වල පැවැත්ම පිළිබඳව ලක්දිව පාලනය කළ විදේශීයන්ගෙන් කිසිඳු සහයක් හෝ සහනයක් නොළත් හෙයින් බෞද්ධ අධ්‍යාපනය කඩාකප්පල් වී ගියේය.

බෞද්ධ අධ්‍යාපනය නංවාලීම සඳහා ශක්තිමත් බෞද්ධ සංවිධාන නොතිබීම නිසා පිරිවෙන් අධ්‍යාපනයේ කිසිඳු පුනර්ජීවයක් ඇති නොවිය. 1889 වනවිට දිවයිනේ බෞද්ධ පාසල් හතරක් පමණ තිබීමෙන් එකල බෞද්ධයන් ලබා තිබූ පරිහානිය අවබෝධ වේ.[26] මෙම පරිහානිදායක තත්ත්වයෙන් මුදවා ගැනීම උදෙසා 1880 කර්නල් එච්.එස්. ඕල්කට් තුමාගේ ලංකා ගමනය සමඟ බෞද්ධ අධ්‍යාපනයේ අභිවෘද්ධියට මංපෙත් විවර විය. විශේෂයෙන් 1888 එච්.එස්. ග්‍රීන් මහතා අධ්‍යාපන අධ්‍යක්ෂක ධුරයට පත් වීමෙන් අනතුරුව බෞද්ධ අධ්‍යාපනය බෞද්ධ පාසල් පිළිබඳවත් යම් අවධානයකට ලක් විය. පන්සල් අධ්‍යාපන ක්‍රමය පරිහානියට පත්ව ඇති බව දුටු ඔහු එහි දියුණුවට පස් වැදෑරුම් යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කරයි. එනම්,

1. කොන්දේසිවලට එකඟව ක්‍රියා කරන පන්සල් පාසල්වලට එක්තරා ආධාරදීමේ ක්‍රමයක් තිබිය යුතුය.
2. ආගමට සම්බන්ධ විෂයයන් හා වෙනත් විෂයයන් ඉගැන්වීම කළ යුතුය.
3. සාමාන්‍යයෙන් ආධාර දීම ක්‍රියාත්මක විය යුත්තේ ශිෂ්‍යයන් ලබන අධ්‍යාපන ප්‍රතිඵල වලට අනුවය.
4. අධ්‍යාපනික තත්ත්වයෙන් ඌව ප්‍රදේශය නොදියුණු මට්ටමක ඇති හෙයින් ආගමික නොවන විෂයයන් සඳහා විභාගයට පෙනී සිටින සෑම ශිෂ්‍යයෙකුටම ඔවුන්ගේ ප්‍රතිඵල අනුව ආධාර දීමට අමතරව තවත් අතිරේක මුදලක්ද දිය යුතුය.
5. පන්සල් පාසලක් වශයෙන් ලබාගන්නා ආධාර යෙදිය යුත්තේ ගිහි ගුරුවරුන්ගේ වේතන සඳහාය.[27]

එහෙත් මෙම යෝජනා ක්‍රමය පිලිබඳව රජයේ අවධානය යොමු නොවූ බව පෙනේ. මේ නිසා පන්සල් අධ්‍යාපන ක්‍රමය පරිහානියට පත්විය.

මෙසේ කටයුතු සිදුවෙමින් පවතිද්දී බෞද්ධ පුනර්ජීවය පිළිබඳ පෙර ලකුණු පහළවන්නට විය. යුරෝපීය පූජකයන්ගේ හා ලාංකික නව ක්‍රිස්තියානි බැතිමතුන්ගෙන් ද සමන්විත ක්‍රිස්තියානි කණ්ඩායම් විසින් ලංකා බෞද්ධයන්ට විරුද්ධව ප්‍රචාරක කටයුතු සිදු කරන ලදි.

මිෂනාරීන්ගේ දරුණු අපවාදයන්ට බෞද්ධාගම ලක්විය. ක්‍රිස්තියානි මිෂනාරීන්ට එවකට ලැබී තිබුණු මුද්‍රණ පහසුකම් වැනි නවීන ප්‍රචාරක මාධ්‍යයන් බෞද්ධයන්ට සුලභ ලෙස නොතිබීම නිසා බෞද්ධයින් විසින් සියම් රටින් ආධාර ඉල්ලා තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස 1862 වර්ෂයේ ගාලු නගරයේ 'ලංකෝපකාර' මුද්‍රණාලය පිහිටුවා එමගින් බෞද්ධ කටයුතුවල නිරතවීමට සමත් වූ පෙනේ. සිංහල භාෂාව උගත් ක්‍රිස්තියානි මිෂනාරීන් විසින් බෞද්ධාගමට පහර ගසන ලදී. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි ප්‍රමුඛ භික්ෂූන් පිරිස මෙම වකවානුවේදී ප්‍රධාන වාද කීපයක් පවත්වා තිබේ. ඒ අතරින් බද්දේගම වාදය (1865), හත්කෝරලේ උදම්විට වාදය (1886), ගම්පොළ වාදය (1873), පානදුරා වාදය යන වාදයන් විශේෂ තැනක ලා සැළකිය හැකි අතර එමගින් බෞද්ධාගම තුළ විශාල අභිවෘද්ධියක් ඇති වූ බව දක්නට ලැබේ. එසේම මෙකල පැවති සරසවි සඳරැස, ලංකා ලෝක (1860), ලක්මිණි පහණ (1862), සමය සංග්‍රහය (1872), අරුණෝදය (1862), ඥාණාර්ථ ප්‍රදීපය (1866), සත්‍ය මාර්ගය (1867) හා සත්‍ය සමුච්චය (1863) යන පුවත්පත් මගින් ද බෞද්ධ ප්‍රබෝධයට ලැබුණු පිටිවහල ඉතා වැදගත් වේ.[28]

1880 ගණන්වල මෙරට පැවති ඉහත සඳහන් කළ ප්‍රසිද්ධ වාද යුරෝපය පුරා ව්‍යාප්ත වීමෙන් පසු ඇමරිකාවේ සිට පැමිණි ඔල්කට් තුමා බෞද්ධයකු වීමෙන් පසුව එහි අභිවෘද්ධියට ක්‍රියා කරනු ලැබීය. බෞද්ධ ජනතාවගේ නොමසුරු ආධාරය ලත් ඔහු ඒ අනුව දිවයිනේ බොහෝ පළාත්වල පාසල් ආරම්භ කර ඇත. මොහුගේ මෙම ව්‍යාපාරයට අනගාරික ධර්මපාලතුමා වැනි ජාති හිතෛෂීන්ගේ ද සහාය ලැබිණි. මෙම කාලය වනවිට බුදු දහමල සිංහල සාහිත්‍ය පිළිබඳ දියුණුවක ආරම්භයක් ඉතා සුළු වශයෙන් කොළඹ නගරයට ආසන්න ස්ථානයක ඇරඹිණි. මෙයට නායකත්වය දෙන ලද්දේ වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්ථවිරයන් විසිනි. නවීන අධ්‍යාපනයට ගැලපෙන පරිදි ප්‍රථම විද්‍යාපීඨය ලෙස සැලකිය හැක්කේ රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන ස්ථානයයි. මෙම ආගමික ආයතනයෙන් බිහි වූ ශිෂ්‍යයින් ලෙස හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ධම්මාලොක, රත්මලානේ ධර්මාරාම වැනි රටට මහගු සේවයක් කළ විද්වතුන් පහළ විය. වර්තමාන ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධයේ මූලිකම ඇති වන්නට මෙම ආයතනය හරහා වර්ධනය වූ ශාස්ත්‍රීය පුනර්ජීවය බෙහෙවින් උපකාරී වූ බව පෙනේ.[29] 19 වන සියවසේ දෙවන භාගයේ මුල සිට අරඹන ලද ජාතික සම්ප්‍රදාය රැක ගැනීමෙ අරගලයේ ඉතා වැදගත්ම ප්‍රතිඵලයක් නම් යළිත් පිරිවෙන් අධ්‍යාපනය ඇරඹීමයි.[30], බෞද්ධ අධ්‍යාපනය ප්‍රගුණ

කිරිවෙන් බෞද්ධ තත්ත්වය යළි නගා සිටුවීමට හැකි බව එවකට සිටි විද්වත්තු අවබෝධ කර ගත්තහ. ඒ අනුව 1873 දී කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ද, 1875 විද්‍යාලංකාර පිරිවෙන ද ඇරඹිය. මෙහි මුලින් සඳහන් කළ ආකාරයට මේ රටේ බෞද්ධාගම දේශීය භාෂා ශාස්ත්‍රය වැනි අංග මුල සිටම රැකුණේ පිරිවෙන් මඟිනි.

මේ අතරින් විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට 1873 සැප්තැම්බර් 27 වන දින 'ලක්රිවිකිරණ' පුවත්පත මඟින් බුද්ධාගම වෙනුවෙන් ලංකාවේ' සියල්ලන්ටම සාධාරණ වූ පාඨශාලාවක් ලැබීම පිළිබඳ යෝජනාවක් ජනතාව වෙත ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ දොන් ෆිලිප්ද සිල්වා, ඇපා අප්පුහාමි හා දොන් බාරොන් වික්‍රමතිලක අප්පුහාමි යන දෙදෙනාගේ අත්සනින් යුතු ලිපියෙනි. වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන්ගේ ඇසුරින් මොවුන් මෙවන් අදහස් ඉදිරිපත් කිරීමට පෙළඹුණු බව තීරණය කළ හැකිය. විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීම පිළිබඳව වැලිවිටියේ සෝරත හිමියන් පවසන්නේ 19 වන සියවසේ අග භාගයේදී මෙරට ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර ඥාණය පිළිබඳ උනන්දුවෙන් හා උන්නතියක් ඇති වූ සමයක ප්‍රථම ප්‍රාචීන විද්‍යා පීඨය ලෙස විශේෂ තැනක් හිමිවන බවයි. සුළුපිරිසකගේ දායකත්වයෙන් ඇරඹි මෙය පසු කාලය වනවිට ඉතා දියුණු තත්ත්වයට පත්විය. යුගයේ අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට අධ්‍යාපන කටයුතු සම්පාදනය කර ගතානුගතික විහාර ආශ්‍රයෙන් අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමයෙහි වෙනසක් මේ තුළින් ඇතිවිය. ජාතියේ ආගමික අරගලය වඩාත් වේගවත් කරවීම සඳහාත් සාර්ථකව පවත්වාගෙන යාම සඳහාත් උචිත ප්‍රබල ආයතනයක් බිහි කිරීමට මෙයින් අපේක්ෂා කරන ලදි. ඉන්දියාවේ ජාතික ව්‍යාපාරය වුවද ප්‍රබල ලෙස නැගී සිටින්නට හේතු වූයේ හින්දු ධර්මයේත්, සම්ප්‍රදායික භාෂා ශාස්ත්‍රීය අධ්‍යපනයත් රැක ගැනීමට අරඹන ලද අරගලය මුල් කර ගනිමිනි.

ඉතා කෙටි කලකින් විද්‍යෝදය පිරිවෙන ජනප්‍රිය භාවයට පත් වූ අතර එහි ප්‍රධාන නාහිමියන් හැටියට හික්කඩුවේ ශ්‍රී සුමංගල පත්විය. විද්‍යෝදය පිරිවෙන පවත්වාගෙන යෑම සඳහා ගිහියන් 13 දෙදෙනකුගෙන් යුත් පාලක සභාවක් 1870 වර්ෂයේ ආරම්භ විය. මෙම 13 දෙනා එවකට කොළඹ ජාතික, ආගමික ව්‍යාපාරය සඳහා උරඳුන් බෞද්ධ ප්‍රභූන් වූහ. මෙම සභාව විද්‍යාධර සභාවේ ලෙස හැඳින්වූ අතර වර්තමාන පිරිවෙන් ඉතිහාසයෙහි ආරම්භයට හේතු වූ විද්‍යෝදය පිරිවෙනේ පාලක මණ්ඩලය

වුයේ එයයි.[32] ආරම්භයේ මෙහි ගිහි හා පැවිදි සුළු පිරිසක් අධ්‍යාපනය ලැබූ අතර ප්‍රථම ත්‍යාග ප්‍රදානෝත්සවයට එවකට ආණ්ඩුකාරයා වූ සර් හෙන්රි ග්‍රෙගරි මහතාට අමතරව පී. රාමනාදන්ල පී. අරුණාචලම් වැනි ද්‍රවිඩ ප්‍රධානීන් ද උඩරට ප්‍රභූ පිරිසක් ද සහභාගිව ඇත. ඉංග්‍රීසි මිෂනාරි බලයත් ඔවුන්ගේ අධ්‍යාපනයත්, ආණ්ඩුවේ ඉහළ අනුග්‍රහයට පත් වූ එවැනි අවධියක පිරිවෙන පිහිටුවා අවුරුදු දෙකක් වැනි කෙටි කාලයකින් මෙවැනි උත්සවයක් සංවිධානය කිරීම ඉතා වැදගත් ක්‍රියාවලියකි. එනිසා නැවත වතාවක් බෞද්ධාගම, සිංහලකම උද්දීපනය වන්නට විය. විද්‍යෝදය පිරිවෙන මඟින් ඉගැන්වීම සඳහා කේන්ද්‍රකර ගත් විෂයයන් තුළින් බෞද්ධ අනන්‍යතාවය තහවුරු විය. ත්‍රිපිටක ධර්මය, සිංහල භාෂාව හා සාහිත්‍යය, පාළිල සංස්කෘත, ප්‍රාකෘත භාෂා ශාස්ත්‍ර මෙන්ම ආයුර්වේදය යන විෂයයන් ඇතුළත් විය. මෙම විෂයයන් ඉගැන්වීමෙන් ජාතික අරගලයට අවශ්‍ය පදනම සැකසෙන්නේ නැති බව හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් පෙන්වා දී ඇත. මෙම පිරිවෙනේ සේවය ලාංකිකයින්ට පමණක් සීමා නොවී කීර්තිරාවය විදේශයන්ගේ ද පැතිර ගියේය. එහි අධ්‍යාපනය ලැබීම පිණිස චිනය. ඉන්දියාව, ජපානය, කාම්බෝජය, සියම වැනි රටවලින් ද ශිෂ්‍යයෝ ඇදී ආහ. එම පෙරදිග රටවලින් පමණක් නොව එංගලන්තයල ජර්මනියල ඇමරිකාව වැනි බටහිර රටවල විද්වතුන් ද මෙහි පැමිණියහ. එසේ පැමිණි අය අතර කර්නල් ඔල්කට් වැනි අය ලංකාවේදී බුදුදහම වැළඳ ගනිමින් බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවා බෞද්ධයන් උදෙසා නොමැකෙන සේවයක් කළේ විද්‍යෝදය පරිවෙන ඇසුරිනි. අනගාරික ධර්මපාල වැනි උගතුන් බිහි වූයේ මෙම පිරිවෙන ඇසුරිනි. එපමණක් නොව ගම්පහ සිද්ධාර්ථයුර්වේද විද්‍යාලය, ගම්පහ බෙහෙත් ශාලාව වැනි ආයතන, සහ සිංහල ඉතිහාසයේ සඳහන් වන විද්වතුන් රාශියක්ම විද්‍යෝදය පිරිවෙනෙහි සිප්සතර හදාරා විහි වූ අය වෙති.

විද්‍යෝදය පිරිවෙන පිහිටුවා අවුරුදු දෙකකට අනතුරුව 1875 අගෝස්තු මාසයේ කැළණියේ තොරණ හන්දියට ආසන්නයේ ශාලාවක ''විද්‍යාලංකාර ශාස්ත'' නම ආයතනයක් වර්ධනය විය.[33] එදා සිට මේ දක්වා ජාතික, සාමාජීය හා ශාස්ත්‍රීය වශයෙන් විද්‍යාලංකාරය ඉටුකර ඇති කාර්‍යභාරය විද්‍යෝදය පිරිවෙන ඉටුකර ඇති කාර්‍යභාරයට වඩා දෙවැනි නොවේ. අධිරාජ්‍යවාදීන් විසින් මෙරට ධර්ම ශාස්ත්‍ර, කලා ශිල්ප විනාශ කර දමමින් තිබුණු අවධියක මෙම ආයතනය බිහි විය. පිරිවෙන පටන් ගැනීමට

පෙර එය විහාරස්ථානයක් ලෙස නොපැවතිණි. විද්‍යාලංකාර පිරිවෙනේ දායක සභාවේ කටයුතු සංවිධානය කරන ලද්දේ එහි ප්‍රථම පරිවේණාධිපති වූ රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන්ගේ අවවාද අනුශාසනා පරිදිය. ආරම්භයේදී මෙම ස්ථානයට ව්‍යවහාර කරන ලද්දේ පිරිවෙන නොව විද්‍යාලංකාර ශාස්ත්‍ර ශාලාව යන නාමයි.[34] පැවති රජයේ ආධාර ලබා නොගෙන නිදහස් ජාතික බෞද්ධ විද්‍යා පීඨයක් ලෙස පවත්වාගෙන යෑමට කටයුතු සංවිධානය වූ බව පෙනේ.

විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීමත් සමගම වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දෙවන ගුරුකුලය එයින් ආරම්භ විය. එයින් ජාතික, ආගමික හා ශාස්ත්‍රීය ක්ෂේත්‍රයෙහි පුනරුදය සඳහා ජාතිහිතෛෂීන් අරඹා තිබුණු අරගලය තවත් වේගවත් විය. දෙස් විදෙස් විශාල පිරිසක් මෙහි අධ්‍යාපනය හැදෑරූහ. ධර්මාලෝක හිමියන් හා ධර්මාරාම හිමියන් විසින් රචිත 'රාජචරිත' නම කෘතිය එංගලන්තයේ වික්ටෝරියා මහ රැජිණට පිරිනැම්මෙන් පසු ඉංග්‍රීසි ආණ්ඩුව පිරිවෙනට ආධාර දීමට ඉදිරිපත් විය. මෙම පිරිවෙනින් බිහි වූ උගතුන් අතර බත්තරමුල්ලේ ශ්‍රී සුභූති ලුණුපොකුණේ ධම්මානන්ද, යක්කඩුවේ ප්‍රඥාරාම, සර් ඩී.බී. ජයතිලක, ආනන්ද කෞශල්‍යායන, ජගදි කාශ්‍යප, අධිරචන්ද්‍ර බැනර්ජි වැනි උගතුන් ප්‍රමුඛය. විශේෂයෙන්ම උරුමය පෙන්වීමට, රැක ගැනීමට බෞද්ධ සංස්කෘතියට හිමිතැන ලබා ගැනීමට විද්‍යාලංකාර අරගලය කළේ අභීත ලෙසිනි.

විද්‍යෝදය හා විද්‍යාලංකාර දෙපිරිවෙන ආරම්භ කිරීමෙන් පසු 1891 වර්ෂය වනවිට තවත් පිරිවෙන් තුනක් ආරම්භ විය. එනම් කළුතර පුලිනතරාරාමය. රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන හා පානදුරේ වැලිපිටියේ පිරිවෙනයි. මෙසේ ක්‍රමයෙන් පිරිවෙන් ආරම්භ කිරීම ගැන රජයේ අප්‍රසාදය පළ නොවීය. විශේෂයෙන් මෙම පිරිවෙන් නඩත්තු වීම වැනි කටයුතු කරනු ලැබූයේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙනි. 1902 අධ්‍යාපන අධ්‍යක්ෂක වශයෙන් සිටි එස්.එම්. බාරොස් මහතා පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය කරුණු පෙන්වා දුන්න ද කවර නම් නිශ්චිත ක්‍රියාමාර්ගයක් රජය විසින් ගතයුතු දැයි ප්‍රකාශ කළේ නැත. ලංකා ඉතිහාසයේ 1902 වර්ෂය තුළ ප්‍රාචීන භාෂා උගතුන් රැස්වී පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. මෙම සභාව කොළඹ .භාෂෝපකාර සමාගම. යන නමින් පිහිටුවා ගැනීම පිරිවෙන් ඉතිහාසයේ ඉතා වැදගත් ස්ථානයක් උසුලයි. මෙම සමාගම පිහිටුවීමත් සමගම

පිරිවෙන් සංඛ්‍යාව ද ක්‍රමයෙන් වැඩිවිය. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් 1917 වර්ෂයේ දී ගණන් ගන්නා ලද නව සංඛ්‍යා ලේඛනයට අනුව එම වර්ෂයේ පිළිගත් අධ්‍යාපන මට්ටමක් ඇති පිරිවෙන් 62 ක් හා තවත් නොදියුණු පිරිවෙන් කීපයක්ද තිබිණි.[35] 1920 වර්ෂය සඳහා රජය විසින් නිකුත් කළ පරිපාලන වාර්තාවට අනුව කොළඹ, කළුතර, ගාල්ල, මාතර, මීගමුව, මහනුවර, නුවරඑළිය, රත්නපුර, කෑගල්ල, කුරුණෑගල, හලාවත යන දිස්ත්‍රික්ක වල මෙබඳු පිරිවෙන් පිහිටුවා තිබිණි. පසු කාලය වනවිට පිරිවෙන් වල වර්ධනය තවත් සීඝ්‍ර වූ අතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් පිරිවෙනකට වර්ෂයකට රුපියල් 400/-ක ආධාර මුදලක්ද ලැබිණි. 19 වැනි සියවසේ බුද්ධාගම කෙරෙහි රජය දැක්වූ ප්‍රතිඵල වල වෙනසක් මේ කාලයේ දක්නට නොලැබුණ ද පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුවට රජයේ මැදිහත්වීම ගැන විරෝධයක් මිෂනාරි සංවිධාන වලින් ඇති නොවීය. මේ අනුව සිංහල සාහිත්‍යයේ හා සංස්කෘතියේ ආරක්ෂාව සඳහා පිහිටි 'බලකොටුව' මෙන් පැවති පිරිවෙනෙහි වැදගත් භාවය 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීමත් සමඟ තව තවත් වර්ධනය විය.

විශේෂයෙන්ම පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීම සඳහා දක්වන ලද උනන්දුව ක්‍රමයෙන් වැඩිවූයෙන් රජයේ උනන්දුව හා ආධාර වැඩිවන්නට විය. 1949 වර්ෂයේ රජය විසින් පිරිවෙන් අධ්‍යාපන පනතක් සම්මත කිරීමෙන් පසු එම අධ්‍යාපනය තව තවත් වැදගත් වෙනස්වීම් වලට බඳුන් විය මෙම පනත නිසා සියළුම පිරිවෙන් මූලික හා උපරිම පිරිවෙන් වශයෙන් කොටස් දෙකකට වර්ග කරන ලදි. මූලික පිරිවෙන් වල ඉගැන්වීමට නියමිත වූයේ සම්මත කරන ලද ප්‍රධාන විෂයයන් හා සම්මතය ලත් අනු විෂයන් තුනක් පමණි. මෙම වර්ගයේ පිරිවෙනෙහි අධ්‍යාපන පටිපාටිය අවුරුදු තුනකට අඩු නොවීමත් අවුරුදු පහකට වැඩි නොවීමත් අවශ්‍ය වේ. මෙම පනතට අනුව පිරිවෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය යහපත් පසුබිමක් ව්‍යාප්ත විය. නිදහස ලබා ගැනීමෙන් අනතුරුව පිරිවෙන නැමති ආයතනයට පැවති ස්ථානය වඩාත් වැදගත් වූ අතර පසු කාලයේ එහි අභිවෘද්ධියට නොයෙක් මංපෙත් විවර වී තිබේ.

මේ අනුව පැහැදිලි වන්නේ පුරාතන අවධියේ සිට ක්‍රමයෙන් වර්ධනය වූ පිරිවෙන් වල ක්‍රියාකාරිත්වය නොයෙක් ගැටීම් වලට ලක්වී ක්‍රමිකව වර්ධනය විය. විශේෂයෙන්ම මහනුවර යුගය වනවිට වැලිවිට සංඝරාජ හිමියන්ගේ 'සිල්වත් සමාගම' තුළින් ලැබූ පන්නරය පෙරටු කොටගෙන 19 වන සියවසේ බෞද්ධාගමික පුනර්ජීවනයට විශාල

පිටුවහලක් විය. බටහිර සංස්කෘතීන්ගේ බලපෑමට යටත් වී එම සිතුම් පැතුම්වලට අනුව රාජ්‍ය පාලනය පවත්වාගෙන ගිය ඉහළ මධ්‍යම පන්තියට අයත් බලතල පහළ මධ්‍යම පන්තියට පැවරීමෙන් පිරිවෙන් අධ්‍යාපනය තවදුරටත් පුළුල් පරාසයක් තුළ ව්‍යාප්ත විය. රටේ අභිවෘද්ධියට ජීව වායුව දුන් මෙම පිරිවෙන් බොහෝමයක් විශ්වවිද්‍යාල බවට පත්වී තවත් ඉතා ඉහළ මට්ටමේ පිරිවෙන් වශයෙන් වර්තමාන සමාජයේ දීර්ඝ ගමනක් ගොස් ඇති බව පෙනේ. පුරාතන අවධියේ සිට සිංහල සංස්කෘතිය, ජාතිය ගොඩනැඟීම වැනි කරුණු සඳහා පිරිවෙන් උපකාරී වූවා සේ විදේශ බලපෑම හමුවේ නොයෙක් බාධක තුළින් දීර්ඝ ගමනක් පැමිණි බව පෙනේ. මෙයින් පැහැදිලි වන්නේ පිරිවෙන් අධ්‍යාපනය තුළින්, එදා මෙන් අද සමාජයට ද ප්‍රයෝජනවත්, සදාචාරාත්මක පිරිසක් ජනිත කිරීමට හැකි වෙතැයි සිතිය හැකි වේ

පාද සටහන්:

1. අධිකාරී, අභයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහා සඟන, ශ්‍රී ධර ප්‍රකාශන, රාජගිරිය, 1991, පිටු 10.
2. දීඝ නිකාය, 111. 117, (සිඟාලෝවාද සූත්‍රය)
3. රංජිත්, රුබේරු, ලංකාවේ අධ්‍යාපන පරිනාමය, එම්.ඩී. ගුණසේන සහ සමාගම, 1964, පිටු 5,
4. එම, පිටු 7.
5. එම, පිටු 8.
6. එම, පිටු 8.
7. අධිකාරී, එම, 1991, පිටු 12.
8. එම, පිටු 14.
9. එම, පිටු 16.
10. පී.ඩබ්ලිව්.ජේ, හේවාවසම්, අධ්‍යාපන සියවස 111 කාණ්ඩය, අධ්‍යාපනික හා සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ, 1969, පිටු 16.
11. අධිකාරී, එම, 1991, පිටු 228.
12. වැගම, පියරතන හිමි, සංඝරාජ මාහිමි. විද්‍යෝදය පිරිවෙනේ ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රකශනයකි, 1997, පිටු 49.
13. මන්දාරම් පුවත (634-647 පද්‍ය)

14. පුංචි බණ්ඩාර සන්නස්ගල, සිංහල සාහිත්‍ය වංශය, පිටු 392.
15. වැගම, පියරතන හිමි, එම, පිටු 29.
16. එස්.එම්. ජයරත්න, වැලිවිට සංඝරාජ හිමි, නිපොන් ග්‍රැපික්ස්, කැළණිය, 2001, පිටු 52.
17. මන්දාරම් පුවත, (ක 497-509).
18. ජයරත්න, එම, පිටු 134.
19. පුංචි බණ්ඩාර සන්නස්ගල, සිංහ සාහිත්‍ය වංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 1962, පිටු 478,
20. එස්.එම්. ජයරත්න, එම, 2001, පිටු 9.
21. එම, පිටු 10.
22. සංඝරාජ සාධුචරියාවල පිටු 10-28.
23. S. Paranavithana, **Gadaladeniya Rock Inscreption of Darmakirthi Sthavira,** Ed. S. Paranavithana, Oxford University Press, London. 1941, p. 92-94.
24. ලංකාවේ ආණ්ඩුක්‍රම පරිපාලන වාර්තාව, 1891, පිටු 21.
25. රාජ්‍ය මන්ත්‍රණ සභා විවාද, රජයේ මුද්‍රණය, කොළඹ, 1931, පිටු 11
26. හැවැන්පොළ, රතනසාර, බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති බුද්ධසමය හා පිරිවෙන් අධ්‍යාපනය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය කැළණිය, 1965, පිටු 179.
27. ලංකාවේ ආණ්ඩුවේ පරිපාලන වාර්තාව, 1876, ඔක්තෝබර් 20, පිටු 25.
28. එස්.පී. පෙරේරා, ලංකා ඉතිහාසය බ්‍රිතාන්‍ය නිදහස්_යුග, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොලඹ, 1945, පිටු 275-280.
29. වැගම, පියරතන හිමි, එම, 1997, පිටු 49-52,
30. ජී. තිලකසිරි, 19 වන සියවසේ ශ්‍රී ලංකාවේ ජාතික_ආගමික අරගලය, ගොඩගේ සහෝදරයෝ, කොළඹ, 2000, පිටු 173,
31. එම, පිටු 38.
32. හැවැන්පොළ, රතනසාර, එම, 1965, පිටු 256.
33. එම, පිටු 276.

34. විද්‍යාලංකාර වජ්‍ර ජයන්ති වාර්තාව, විද්‍යෝදය ශිෂ්‍ය සමිතිය මඟින් ප්‍රකාශිතයි, පිටු 13.

35. හැවැන්පොළ, රතනසාර, එම, 1965, පිටු 362.